# Living the Lotus



7
2022
VOL. 202

*Buddhism in Everyday Life*

***Founder's Reflections***

## දිනපොත යනු මාගේ ඉතිහාසයයි

මම සෑම දිනකම සිදුවූ සිදුවීම් දිනපොතේ සටහන් කිරීම පුරුද්දක් බවට පත්කරගෙන, උදෑසන අවදිවුනේ කීයටද? හමුවෙනේ කාවද? මොනවගේ සිදුවීම් වලට මුහුණදුන්නාද? යනුවෙන් දවසේ මුහුණපෑ සිදුවීම් සටහන් කරමින් පැමිණියා.

තරුණ අවධියේ සිටම එය නොකඩා සිදුකරන විට ලෝකය ගැන, තමා ගැන, ටිකෙන් ටික වාස්තවිකව බැලිමට හැඩගැසී තිබෙන බව මට වැටහීගියා.

යලි ගෙවුනු ජීවිතය දෙස හැරී බැලීමේදී, බලාපොරොත්තු වූ පරිදි මට මේ තැනින් ගැලවීමට හැකිවේදැයි සිතෙන තරම් අමාරු ප්‍රශ්ණ වලට මැදිව ගතකල අත්දැකීම් තිබෙන නිසා, එම දුෂ්කර අවස්ථාවන් තමාගේ ජීවිතයේ වර්ධනය උදෙසා රුකුලක් වූ බව මට අවබෝධ වුනා. සටහන් කර තිබෙන සරළ සිදුවීම් වුනත්, නැවත එය කියාවා බැලීමේදී ඒ කාලයේ ගෙවුන මතකයන් සිතට නැගුනද ඒවා යලි යා නොහැකි මාගේ ඉතිහාසය බවට පත්ව තිබේ.

අන් කිසිවකටත් වඩා වැදගත් යැයි සිතන්නේ, එම මතකයන් තුලින්, මේ වනතෙක් මගේ ජීවිතයේ ගෙවුනු හැම සිදුවීමක්ම අත්දැකීම් එකක්වත් වැඩකට නැතැයි බැහැරකල නොහැකියි යන්න සිතට දැනීමයි. එම නිසා නැවත දිනපොතේ සෑම දිනයක් අවසානයේම 'බොහොම ස්තූතියි' යැයි නොලියා සිටීමට නොහැකිය.

නිර්මාතෘ සංකල්පනා ග්‍රන්ථය ඇසුරිනි. 10, P. 282-283

රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය 1938 වර්ෂයේදි නික්යෝ නිවානෝ තුමා හා මියාකෝ නගනුමා මහත්මිය විසින් ස්ථාපිත කරන ලදී. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය මූලික කරගෙන එහි කටයුතු කරනු ලැබේ. පවුල තුලත්, කාර්යාලයේදීත්, සමාජයේදීත් බුදු දහම ජීවිතයට බද්ධ කර ගෙන, සාමාකාමී ලෝවක් බිහි කිරීමට ප්‍රාර්ථනා කර කටයුතු කරන එකමුතුවකි.

වර්තමානයේදී නිචිකෝ නිවානෝ ප්‍ර ධානීතුමාගේ මූලිකත්වයෙන්, සාමාජික සාමාජිකාවන් සෑම ධර්ම ව්‍යාප්තියේ යෙදෙමින් අත් වැල් බැදගෙන සෑම රටකම සාම ක්‍රියාකාරකම් වල නියැලි සිටියි.

Living the Lotus
Vol. 202 (July 2022)

Senior Editor: Keiichi Akagawa
Editor: Jigjidkhorloo Gereltuya
Copy Editors: Ruklanthi Palipana,
Sahan Chamara , Rajitha Madurangha

*Living the Lotus* is published monthly
by Rissho Kosei-kai International,
Fumon Media Center, 2-7-1 Wada,
Suginami-ku, Tokyo 166-8537, Japan.
TEL: +81-3-5341-1124
FAX: +81-3-5341-1224
Email: living.the.lotus.rk-international
@kosei-kai.or.jp



# එදිනෙදා සාමන්‍යය දිවි පෙවෙත  වීර්යය - ①

නිච්කෝ නිවානෝ තුමා
ප්‍රධානී, රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය

## වීර්යය යනු

මම නිතරම පවසන දෙයක්නම්, 'වීර්යය වඩන්න, වීර්යය වඩන්න මරණාසන්නය දක්වාම වීර්යය වඩන්න, නැවත උප්පත්තිය ලැබුවද නැවත වීර්යය වඩන්න' යන්නයි. 'සර්ව සම්පූර්ණ' මිනිසුන් නොමැති නිසා තමාගේ ප්‍රගතිය සහ දියුණු වීමට ඇති ආශාව අමතක නොකිරීමට වගබලා ගතයුතුය.

කෙසේ වෙතත්, වීර්යය යන වචනයේ පරිසමාප්ත අර්ථය වටහා නොගෙන එය ඇසූ පමණින්, වීර්යය වැඩීම පිණිස සැළකිය යුතු පෙර සූදනමක් අවශ්‍යයයි යැයි හැඟී, 'මට එය කල නොහැකියි' යැයි පසු බසින පුද්ගලයන්ද සිටී.

එසේනම්, වීර්යය යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද?

බුදු දහමේ මෙය හැඳින්වෙන්නේ 'එක සිතින් ධර්මය පුරුදු පුහුණු කරමින් බුද්ධ මාර්ගයේ ගමන් කිරීම' යනුවෙනි. දෝගෙන් සෙන් යතිවරයානන් වීර්යය යනු, 'සියළුසත්වයන්ගේ හිතසුව පිණිස, විවේකයක් නොගෙන යහපත්දේ කිරීම' යැයි පවසන නමුත්, විවේකයක් නොගෙන කටයුතු කිරීම වේදනාවක් ගෙනදෙන්නක් බවනම් නිසකය.

මට මෙහිදී මතකයට නැගෙන්නේ 'එදිනෙද ජීවිතයේ සාමාන්‍යය දෙවල් සාමාන්‍යය ලෙස කල හැකි පුද්ගලයෙකු බවට පත් වන්න' යන නිච්කෝ නිවානෝතුමාගේ වදනකි. ගිහියන් වන අපිට, විවේකයක් නොගෙන කටයුතු කිරීම, කවද වුනත්, කුමන ස්ථානයක් වුනත් 'බුද්ධ මන්දිරයක්' යැයි සිතා කටයුතු කිරීමවේ. එසේ සිතනවානම් වීර්යය යනු, කරන්නන් වාලේ ධර්මය පුහුණු කිරීමකට වඩා, එදිනෙද ජීවිතය තුල අන් අය ගැන සිතමින්, සෑම දෙනාටම සාමය උදකරදෙන වචන භාවිතය සහ ඉරියව් පිළිබඳ සැලකිලිමත්වීම, බෞද්ධයෙකු ලෙස සාමාන්‍යය ලෙස ජීවිතය ගත කිරීම වේ.

බුදු දහම පිළිබඳ විශාරදයෙකු වන කුබෝතා ෂොන්බු ගුරුතුමා 'සෑම විටම සෑම කල්හිම සදධර්ම පුණ්ඩරීක සූත්‍රය කියවන්න' යන කියමන තුලින්, ධර්මය 'ජීවිතයට බද්ධකරගෙන කටයුතු කිරීමේ' වැදගත්කම සහ, ධර්මය ජීවිතයට පුරුදු පුහුණු කිරීම තුලින්, ධර්මය එදිනෙද ජීවිතය තුල ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවිය හැකිය යන කෘතවේදීත්වය අපිට කියාදෙන අතර, අපි වඩන්නාවූ වීර්යය නිසකවම අපි කරන්නාවූ එදිනෙද ක්‍රියාකාරකම් තුල ගැබ්ව තිබේ.

## සත්‍යාවබෝධය සහ විර්යය එකට බැඳී පවතී

දෘශ්‍යාභාදිත භික්ෂුවක්, තම ඉරුණු සිවුර මැසීමට සැරසෙන අවස්ථාවේදී 'කවුරුන්හෝ කෙනෙක් මේ ඉදිකටුවට නූල දමා දෙනවාද' යැයි විමසූ විට, 'මට ඒ පින සිදුකර ගැනීමට අවස්ථාව දෙනවාද' යැයි විමසූ  බුදුන් වහන්සේ ඉදිකටුවට නූල දමා දුන් කතාව ඔබ අසා තිබෙනවා යැයි සිතනවා.

සියළු සර්වඥතා ඥානයන්ගෙන් පරතෙරට පත් බුදුන් වහන්සේ පැවසූ දෙයට සහ උන් වහන්සේගේ ක්‍රියාකලාපය දැක විමතියට පත්ව සිටින ශ්‍රාවකයන් දුටු බුදුන් වහන්සේ 'අනුරුද්ධයනි අන් අය ගැන සිතා කටයුතු කිරීමට සීමාවක් නොමැත. මම අන් කිසිදෙයකටත් වඩා සන්තෘෂ්ඨීය ප්‍රාර්ථනය කරමි' යැයි පවසා සිටියා. තනතුර, උගත්කම උසස් පහත් යැයි වෙනසක් නොකර, අන් අය ප්‍රථමයෙන් යැයි සිතා කටයුතු කරමින් හදවත ඔපමට්ටම් කිරීම තුළින් පරම සතුට ලැබෙන බවත්, එය නොකඩවා සිදු කිරීම වීර්යය බවත් කාරුණිකව පහදා දුන්නා.

මෙම කතාව 'පළමු ත්‍යාගය' 'සත්‍යාවබෝධය සහ වීර්යය එකට බැඳී පවතී' යන කියමන පරිදි, ධර්මානුකූලව කටයුතු කිරීම සත්‍යාවබෝධය ලබාගැනීමේ සංකේතයකි. සත්‍යාවබෝධය ලැබීම තුළ වීර්යය වැඩීමේ සතුට ගැබ්ව තිබේ. සත්‍යාවබෝධය ලබා ගැනීමේ මාර්ගය වීර්යය වැඩීම යැයි දකිනවාට වඩා, අන් අයගේ සතුට උදෙසා කටයුතු කරන සෑම විටම අපගේ බුද්ධ ස්භාවය දිදුළමින්, බුද්ධ ස්භාවය පිළිබඳ තම යථා අවබෝධය ගැඹුරුවී, වීර්යය වඩන තැනැත්තාට ශ්‍රද්ධාවේ නියම සංතෘප්තිය අත්විදිය හැකිය.

කෙසේ නමුත්, බෞද්ධයෙකු ලෙස 'සාමාන්‍ය දේ සාමාන්‍යලෙස' පුරුදු පුහුණු කිරීම වැදගත් යැයි කල්පනා කරමින්, ආත්මාර්ථකාමීත්වයට, තෘෂ්ණාවට, අලසකමට යටපත් වී 'සාමන්‍යලෙස කලයුතු දේ කිරීමට නොහැකිව' අපි ලතැවෙමින් සිටී.

කෙසේ වෙතත් එවනි අවස්ථා වලදී 'එසේ නොකළයුතුයි' යැයි සිතන පුදගලයන්ද සිටී. එක මොහොතකට හෝ එසේ සිතනවානම් ඒ පිළිබඳ බිය නොවන්න. තම හදවතේ එවැනි හැගීමක් ඇති වන්නේ නැතිනම් කිසිවක් වෙනස් කල නොහැකි අතර, දැනටමත් එවැනි සිතුවිල්ලක් සිතේ තිබෙනවානම්, අවස්ථාවක් ලැබුනු වහාම ආපසු තම හදවත යථා තත්වයට ගැනීමට ඒ සිතුවිල්ල හේතු වනු ඇත.

අලස හදවත වීර්යය වැඩීමේ හදවතක් බවට පත්කර ගැනීමට නම්, 'එසේ නොකළයුතුයි' යන සිතුවිල්ල පසුවිපරම් කර බලන්න. එසේ පසුවිපරම් කිරීමෙන් යහපත්ව ජීවත්වන්න ඕනා යැයි අධිෂ්ටාන කල විට,සිතාගැනීමට නොහැකි තරම් වූ අභිලාෂයකට පත්වන බව නොඅනුමානය.

මේ ආකාරයට ජීවත්වන බවට ප්‍රාර්ථනය කිරිර්ම 'අභිප්‍රාය' ඉතාම වැදගත්වේ. එම අභිප්‍රායට රුකුලක් වන එදිනෙදා ජීවිතයේදී වීර්යය වැඩීම, පරාර්ථකාමීව කටයුතු කිරීම ලෝක සාමයට මග පාදන පදනමක් වනවා නිසකය.

From *Kosei*, June 2022.

# අභියෝග තම වර්ධනයේ මූලාශ්‍රය කරගමු

තායිනාන් ධර්ම ශාඛාව තායිවානය

රොන්ග්සි චෙන් මහත්මිය

මෙම සෙප්පෝව 2022 අවුරුද්දේ අප්‍රේල් මස 8 වන දින තායිනාන් ධර්ම ශාඛාවේදී බුදුන් වහන්සේගේ ජන්ම දින සැමරුම් උත්සවයේදී ඉදිරිපත් කරන ලද්දකි.

මම 1960 අවුරුද්දේ තායිවානයේ තායිනාන් නගරයේදී පවුලේ දෙවන දරුවා ලෙස උපත ලැබූ අතර, මගේ පවුල එක් වැඩිමහල් සහෝදරියෙක් හා බාල සහෝදරයන් දෙදෙනෙකු ගෙන් යුත් පවුලක් වුනා. මා තරුණවියට පත්වූ පසු බැංකුවක රැකියාවක් කරමින් දෙමාපියන් සමග ජීවත් වූවා. කෙසේ වෙතත් මා රැකියාව කල බැංකුව වෙනත් බැංකුවක් සමග ඒකාබද්ධ වීම හේතුවෙන් මා රැකියාවෙන් ඉවත් වූවා. පසුව මා ආඝාතය වැළඳුණු මගේ මව රැක බලා ගැනීමට මගේ කාලය වැයකලා. මගේ මව 2010 අවුරුද්දේදීත්, තාත්තා 2016 අවුරුද්දේදීත් නැතිවූ අතර ඉන් පසුව මා තනිව ජීවත් වූවා. මම කෝසෙයිකායි දෙවන පරම්පරාවේ සාමාජිකයකු වන අතර දැනට මා ධර්ම ශාඛාවේ ගණකාධිකාරවරියක් ලෙස සේවය කරනවා.

1992 දී, මගේ තාත්තා පැරණි පාසල් මිතුරකු මාර්ගයෙන් රිෂ්ෂෝ කෝසෙයිකායි සංවිධානයට සම්බන්ධ වූ අතර, 1997 අවුරුද්දේ මැයි මස තෝකියෝ ප්‍රධාන ධර්ම මන්දිරයේදී බුද්ධ ප්‍රතිමාවද ලබාගත්තා. ඔහු තම ස්කූටරයෙන් දිනපතා ධර්ම ශාඛාවට ගිය නමුත්, වයස අවුරුදු 80 කට වැඩි තාත්තා මවගේ අභාවයෙන් පසු වේගයෙන් දුර්වල වීමට පටන් නිසා මම, දිනපතා ඔහුව ධර්ම ශාඛාවට රැගෙන ගොස් නැවත රැගෙන එමටත් පටන් ගත්තා. මම නිවසේ බුදු පිළිමයට දිනපතා වන්දනාමාන කරමින් තාත්තා වෙනුවට සූත්‍ර සජ්ජායනය කිරීමටද පටන් ගත්තා. තාත්තා මියයන තුරුම වසර හයක් ඔහුව ධර්ම ශාඛාවට රැගෙන ගියද එක් අවස්ථාවකවත් මා ධර්ම ශාඛාවට ඇතුලුවිය යුතුයි කියා සිතුවේ නැත.

මගේ තාත්තාගේ අභාවයෙන් පසු, එවකට ධර්ම ශාඛාවේ භාණ්ඩාගාරික ලෙස කටයුතු කල ෂුෆෙන් වැන්ග් මහත්මිය තාත්තාගේ ඔකයිමියෝ (මරණින් පසු සූත්‍ර සජ්ජායනය කිරීම සඳහා විශේෂයෙන් සාදන ලද නමක්) එක ලබාදී ඒ සඳහා මට මග පෙන් වූ අතර, වැන්ග් මහත්මියගේ මග පෙන්වීමෙන් මා 2016 අවුරුද්දේ සැප්තැම්බර් මාසයේ කෝසෙයි කායි සාමාජිකත්වය ලබාගත්තා. මුල් කාලයේ ධර්ම ශාඛාවට ගියේ සූත්‍ර සජ්ජායනය සඳහා විතරයි. නමුත්, 2017 දී, වැන්ග් මහත්මියගේ නිර්දේශයෙන් මා හට ගණකධිකාර රාජකාරිය පැවරුණු අතර, දිනපතා ධර්ම ශාඛාවට යාමට පටන් ගත්තා. රාජකාරී කිරීමට අවස්ථාව ලැබුණු මොහොතේ මා සිතුවේ රිසිට් පත් ලිවීම නිවැරදිව කල යුතුයි යන්න පමණයි. කෙසේ වෙතත්, 2019 දී, එවකට සභාපතිව සිටි මින්හුඑයි වු මහතා සමග මූලස්ථානයේ පැවති රාජකාරීන්හි වැදගත්කම තේමාව කොටගත් සම්මන්ත්‍රණයකට සහභාගී වූ අතර, එහිදී, මා රිසිට්පත් ලිවීම හරහා ධර්මයට සම්බන්ධ වී ඇති බවත් මා හරහා බුදුන් වහන්සේත් සාමාජිකයිනුත් සම්බන්ධ වී ඇති බවත් ඉගෙනීමට ලැබුනා. ගණකාධිකාර රාජකාරියෙහි මෙතරම් වටිනාකමක් ඇතැයි කියා මා කිසි විටෙකත් සිතුවේම නැහැ.

මීට කලකට පෙර පළමු වරට බුදුන් වහන්සේ වැඩ සිටින බව හැඟුණු අමුතු අත්දැකීමක් ලැබුණා. තාත්තාගේ අභාවයෙන් පසු පළමු පිංකමට පෙර මගේ වැඩිමහල් සහෝදරයාගේ බිරිඳ තාත්තා ගැන සිහිනයක් දුටු බව පැවසූ අතර එහි, තාත්තා කෝසෙයිකායි හි කලු කෝට් කිට් එකක් ඇදගෙන ඔතසුකියක් පැළඳගෙන යමක් ඉල්ලාසිටින ආකාරයෙන් දිස් වූ බව පැවසූවා. එය ඇසූ විට, තාත්තාගේ මිනී පෙට්ටිය තුලට ඔහුගේ ඔතසුකිය දැම්මෙ නැනේද කියා මට මතකයට නැගුණු අතර, තාත්තා ඔතසුකියට ආසාවෙන් ඉන්න නිසා මෙලෙස සිහිනෙන් දකින්න ඇති කියා සිතුනා. පිංකමෙන් පසුව තාත්තාගේ එම ඉල්ලීම ඉෂ්ඨ කලයුතුයි කියන හැගීමෙන් තත්තාගේ ඔතසුකිය පුළුස්සා දැමුවා.

ඉන් පසුව 2019 අවුරුද්දේ මැයි මාසයේ දිනක් මා මගේ නිවස අසලම හංදියකදී වමට හැරවීමට ගිය අවස්ථාවක



චෙන් මහත්මිය බුදුන් වහන්සේගේ ජන්මදින සැමරුම් උත්සවයට සාහාගී වු අවස්ථාවක්

රිය අනතුරකට ලක් වුනා. අනතුරට ලක් වූ අනෙක් පුද්ගලයා කායික හා මානසිය ආබාධයකින් පෙළෙන පුද්ගලයකු වූ අතර අනතුරෙන් බරපතල තුවාල වූවා යැයි සිතා මා බිය වූවා. කෙසේ වෙතත් වෛද්‍ය පරීක්ෂණයට අනුව රෝහල් ගත කිරීමට අවශ්‍යය නොවන බවත් නිවසේ සිට ප්‍රතිකාර කලහැකි බවත් දැන ගත් පසු මට ලොකු සහනයක් දැනුනා. ඒ වගේම බුදුන් වහන්සේගේ ආශිර්වාදයෙන් ලොකු අනතුරක් වූයේ නැනේ කියා දැනී කෘතඥ වීමට හැකිවුනා. දිනපතා සූත්‍ර සජ්ජායනය තුලදී ඔහුට ඉක්මන් සුවයද පැතුවා. කලක සිට මා හඳුනන ප්‍රදේශයේ ග්‍රාමසේවක මහතාගේ මැදිහත් වීමෙන් අනතුරට පත් වූ අනෙක පුද්ගලයා සමග ගැටලුවකින් තොරව සමතයකට පත්වීමට හැකිවුනා. මේ සිදුවීම මුල් කරගෙන ධර්ම ශාඛාවේ ධර්ම පුහුණුවේ යෙදීමට තීරණය කලා.

මීට අවුරුදු දෙකකට පෙර අගෝස්තු මාසයේදී සිදුකල වෛද්‍ය පරීක්ෂණයකදී මගේ අක්මාවේ ගෙඩියක් ඇතිබව සොයා ගත්තා. වෛද්‍යවරයාගේ මතයට අනුව එය මාරාන්තික විය හැකි බැවින් ඉක්මනින්ම සම්පූර්ණ පරීක්ෂාවක් කිරීමට සිදු වුනා. පසුදින ධර්ම ශාඛාවට ගොස් වර්තමාන කියෝකයිචෝ රෙයිසින්හු හට මගේ අසනීපය ගැන පැවසූ විට, පරම්පරා හතරක ආදි මුතුන් මිත්තන් වෙනුවෙන් පිං අනුමෝදන් කිරීමට සූත්‍ර සජ්ජායනයක් කරන ලෙසට උපදෙස් ලබා දුන්නා. ඒ අනුව ආදි මුතු මිත්තන් වෙනුවෙන් ඔකයිමියෝ ලබා ගත් අතර ප්‍රමාණය වැඩි නිසා කණ්ඩායම් හතරකට බෙද සූත්‍ර සජ්ජායන හතරක් සිදු කලා.

මගේ තාත්තාට බුදු පිළිමය ලැබී මේ වන විට වසර විස්සක් පමණ ගතවී ඇති නිසා එහි දෑත් අවපැහැවී කළු පැහැයට හැරී තිබුනා. නමුත් පුදුමය නම්, පළමු සූත්‍ර සජ්ජායනය අවසන් වන විට බුදු පිළිමයේ දකුණු අත රන්වන් පැහැයට හැරී එයින් මුළු පිළිමයම ආලෝකමත් වීමයි. එය මගේ බාල සහෝදරයා සහ ඔහුගේ බිරිඳත් මට පැවසූවා. එයින් අපි හැමෝම පුදුමයට පත් වූ අතර, එම අත්දැකීමෙන් මිනිසුන්ට පෝෂණය අවශ්‍ය සේම බුදුන් වහන්සේටත් පෝෂණය අවශ්‍ය බව වැටහුනා. ඒ වගේම හදවතින්ම සූත්‍ර සජ්ජායනය කරන්නේනම්, අනිවාර්යයෙන්ම බුදුන් වහන්සේට සම්බන්ධ වන බව මට අවබෝධ වූවා.

මගේ වෛද්‍ය පරීක්ෂණ වාර්තා ලැබීමට ප්‍රථම සූත්‍ර සජ්ජායනයන් හතරම අවසන් කරන ලෙසට හු මහත්මිය මට අවවාද කල අතර මා රෝහලට යාමට දින තුනකට පෙර සූත්‍ර සජ්ජායනයන් අවසන් කලා. පරීක්ෂණ වාර්තාව ලබා ගන්නා විට වෛද්‍යවරයා පැවසූවේ මගේ අක්මාවේ මේදය වැඩි බවත් වෙනත් අසාමාන්‍යතා නොමැති බවත්ය. මට නැවත වරක් බුදුන් වහන්සේගේ ආශිර්වාදයේ රැකවරණය හොඳින් දැනුණා. විශාල කරදරයක් කුඩා කරදරයක් බවට පත්වීම ආදි මුතුන් මිත්තන් වෙනුවෙන් සූත්‍ර සජ්ජායනය කිරීමේ ආනිසංසයක් බව මට වැටහුණා.

මේ අවුරුද්ද මුලදී, මගේ නැනාගේ වකුගඩුවේ තිබූ ගෙඩියක් පිපිරී අභ්‍යන්තර රුධිර වහනයක් හේතුවෙන් අසාධ්‍යවී රෝහල් ගත කිරීමට සිදුවුනා. පසුව මා ධර්ම ශාඛාවට ගොස් ඒ පිළිබදව කියෝකයිචෝ සාන් සමග සාකච්ඡා කලා. එවිට වහාම නැනාට සුවය ප්‍රාර්ථනා කරමින් සූත්‍ර සජ්ජායනයක් කරන්නැයි උපදෙස් ලබා දුන් අතර, එදිනම ජ්‍යේෂ්ඨ සාමාජිකයින් සමග නැනාගේ සුවය ප්‍රාර්ථනා කර සූත්‍ර සජ්ජායනයක් සිදු කලා.

නැනා රෝහල් ගතවී සිටින විට ඇයට නින්ද නොයන නිසා මුකුත් කරන්න බැයිද කියා මල්ලී මගෙන් විමසා සිටි අතර, එවිට මා ඔහුට ඔතසුකියක් ලබා දී මෙය නැනා ලගින් තබන්න කියා උපදෙස් දුන්නා. ඊට මද වේලාවකට පසුව කතා කර බලන විට හොඳින් නින්ද ගොස් ඇති බව දැනගන්න ලබුනා.

නැනා ටිකට් කපාගෙන නිවසට පැමිණි පසු ඇගේ දරුවන්ට තනිව ඇයව බලාගැනීමට අපහසුයි කියා සිතුණ නිසා මම ධර්ම ශාඛාවට ගොස්, නැනාව බලාගැනීමට මල්ලීගේ නිවසට යන බැවින් දින කිහිපයකට ධර්ම ශාඛාවට පැමිණීමට නොහැකියි කියා කියොකයිචෝ සාන්ට දැණුම් දුන්නා. නමුත් මේ වෙලාව, දරුවන්ගේ වර්ධනයට හා දෙමාපියන්ට කෘතගුණ දැක්වීමට ඔවුනට ලැබෙන හොඳ අවස්ථාවක් යැයි කියෝකයිචෝ සාන් පැවසූ නිසා මම මල්ලීගේ නිවසට නොයාමට තීරණය කලා.

ධර්ම ශාඛාවේදී තව දින කිහිපයකින් පවත්වන ආදි මුතුන් මිත්තන් වෙනුවෙන් පිං අනුමෝදන් කිරීමේ වැඩසටහනේදී නැනාගේ මුතුන් මිත්තන් වෙනුවෙන්ද පිං අනුමෝදන් කරන ලෙසට කියෝකයිචෝ සාන් මට උපදෙස් දුන්නා. ඒ සඳහා මා නැනාගෙන් තාත්තාගේ නම විමසූ විට, ස්වාමියාගේ පමණක් නොව ඇයගේ ආදි මුතුන් මිත්තන්ටත් පිං අනුමෝදන් කරන බව දැනගත් පසු ඇය පුදුමයට මෙන්ම සතුටට පත් වුනා. ඊට පසු ඇය රෝහල් ගතවී සිටින විට රෑ හීනෙන් එයාගෙ සීයා එයාට කතාකල බවත්, එයට



හෝසා වටයක් පවත්වන චෙන් මහත්මිය
(දකුණු පස සිට හතරවෙනියා)

බයවී නින්දෙන් ඇහැරුණ බවත් පවසා සිටියා. එය ඇසූ කල මගේ ඇග හිරිවැටුණ නමුත්, එයින් මට බුදුන් වහන්සේගේ කරුණාව ගැන පහැදුනා.

මෙම සිදුවීම බුදුන් වහන්සේ කියෝකයිචෝ සාන් හරහා, මගේ නැනාට ආදි මුතුන් මිත්තන් වෙනුවෙන් පිං අනුමෝදන් කිරීමට මග පෙන්වීම සඳහාත්, එහි ආනිසංස වටහා ගැනීමටත්, ලබාදුන් අවස්ථාවක් කියා මට වැටහුනා. නැනාගේ තාත්තා මිය ගිය පසු ඇය අසනීප වූ බවත්, එක දිගටම පවුල තුල ප්‍රශ්න ඇතිවූ බවත්, ඒ සියල්ල සුළු ප්‍රශ්න යැයි දැන් හැගෙන බව පැවසුවා. එය කියෝකයිචෝ සාන්ට දැන්වූ විට 'සියල්ල අනිත්‍යයැයි' ඉගැන්වූ අතර, එය වටහාගෙන අන් අයට සලකමින් ජීවත් වන්නේනම්, බුදුන් වහන්සේගේත්, ආදි මුතුන් මිත්තන්ගේත් ආරක්ෂාව සහ රැකවරණය ලැබෙන බව පැවසුවා.

මට ඇති වූ කිසිම ගැටලුවක් පුරෝකථනය කල නොහැකි බව මා ඉගෙනගත් අතර, 'සියල්ල අනිත්‍යයැයි' පිළිගැනීමට හැකි වූයේ රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයේ ඉගැන්වීම් නිසාත්, කියෝකයිචෝ සාන්ගේ මගපෙන්වීම් නිසාත් වේ. අනිත්‍යතාවයට මුහුණදෙන් විට එය ඒ ආකාරයෙන් පිළිගැනීම හැර කල හැකි වෙන කිසිවක් නොමැත. සිදුවන වෙනස්වීම් ඒ ආකාරයෙන්ම පිළිගන්නේනම්, සියල්ල සුභදව විසදගත හැකි වේ යැයි ඉගෙන ගත් නිසා, ජීවිතයේ අප මුහුණදෙන වෙනස්වීම් යමක් ඉගෙනීමට ලැබෙන අවස්ථාවන් කියාත්, අභියෝගයන් තමාව වර්ධනය කරන ලෙසත් සිතන්නට හැකිවුනා. සියල්ල බුදුන් වහන්සේ මට ලබාදෙන අභියෝග කියා සිතා විශ්වාසයෙන් කටයුතු කිරීමට හැකිනම්, සතුටින් ධර්මය ඉගෙනීමට හා පුහුණු කිරීමට හැකිවේ.

මම ස්භාවයෙන්ම ඉතා ශුභවාදී සහ අවංක නිසා මා අවට පුද්ගලයින්ව රිද්දුවත් මට එය දැණුනේ නෑ. නමුත් මා ධර්ම ශාඛාවට ගිය පසු නොදැනිම මා මාව වෙනස් කර ගත්තා. මම යමක් කියන්නට පෙර එය පැවසීම සුදුසුද නැත්ද යන්න කල්පනා කිරීමට වගේම යමෙකුගේ වැරැද්දක් දුටු විට මාත් ඒ වැරැද්දම කරනවානේ කියා සිතා කටයුතු කිරීමට පුරුදුව සිටිනවා. ඒවගේම, ආත්මාර්ථකාමීත්වයෙන් දුරස්වීම සඳහා 'යහපත් දේ කිරීම' 'යහපත් දේ කතා කිරීම' සහ 'අනුනට කරුණාවන්ත වීම' යන කාරණා තුන ප්‍රායෝගිකව පුහුණු කරමින් ඉන්නවා.


මම මුලදී ආගම ගැන විශ්වාස කලේ නෑ. මම තරුණ කාලයේදී එක් පුද්ගලයෙක්, මම අනාගතයේදී බුද්ධ මාර්ගයේ ගමන් කරන බව පැවසුවා. කෙසේ වෙතත් මා, පවුල සමග සතුටින් ජීවත් වීම තමා වැදගත්ම කාරණාව කියා සිතාගෙන සිටි අතර බුදු දහම පුහුණු කරනවා යන්න සිතන්නට නොහැක්කක් වූවා. ඒ කෙසේ වෙතත්, බුදුන් වහන්සේ මට රිෂ්ෂෝ කෝසෙයිකායි සංවිධනයට සම්බන්ධ වීමට අවස්ථාව සලසා දුන්නා. මෙයට හේතුව කෝසෙයිකායි සංවිධානය පවුල් ජීවිතය අගය කොට සලකන නිසා යැයි කියා මා සිතනවා.

මා තවමත් ධර්මය ඉතාමත් හොඳින් තේරුම් ගෙන නැතත්, ඉගෙනගත් දේ ප්‍රයෝගිකව පුහුණු කරමින් කටයුතු කරනවා. තව තවත් බොහෝ තරුණ තරුණියන්ටත් බුදුන් වහන්සේ සමග සම්බන්ධ වීමට සහ කෝසෙයිකායි හි ඉගැන්වීම් අධ්‍යනය කිරිමට අවස්ථාව ලබාදීමට කැපවෙමි. ඒ වගේම අනෙක් සාමාජිකයින් සමග සතුටින් බුද්ධ මාර්ගයේ ගමන් කිරීමට පොරොන්දු වෙමි.
බොහොම ස්තුතියි.

# රිෂ්ෂෝ කෝසෙයි කායි හැඳින්වීම

## බුදුන් වහන්සේගේ ජීවිතය සහ බෞද්ධ ඉගැන්වීම්

ගිහිගෙය හැර යන බුදුන් වහන්සේ භික්ෂූන් වහන්සේ නමක් හමුවී එහි ශ්‍රාවකයෙකු වී ධර්ම කරුණු ඉගෙන ගත්තා. කෙසේ වෙතත් වයසට යාම, රෝගාතුර වීම සහ මරණය යන දුකෙන් මිදීම් නම් වූ නිවන අවබෝධ කර ගැනීමට එයින් නොහැකි යැයි සිතා තනිවම වනාන්තරයට ඇතුළු වී දුශ්කරක්‍රියා කිරීම ආරම්භ කලා. එය එකල පැවති ඇදහීම් ක්‍රමයක් වූවා. දිනකට එක් බත් ඇටයක් පමණක් අනුභව කිරීම, දිගු වේලාවක් හුස්ම අල්ලාගෙන සිටීම වැනි දැඩි දුශ්කර ක්‍රියාවන් සිදුකලා. නමුත් දුකින් මිදීමේ මාර්ගය අවබෝධ කර ගැනීමට නොහැකි වූවා.






**ඔබේ දැනුමට**

බුදුන් වහන්ස දුශ්කරක්‍රියා කරන කාලයේ ආලාර සෙනින්ගෙන් ඉගෙනගත්තා. ආලාර සෙනින් බුදුන් වහන්සේගේ තේරුම් ගැනීමේ ශක්තිය ගැන වටහාගත් අතර, තම ශ්‍රාවකයෙකු වේ යැයි සිතුවත්, බුදුන් වහන්සේ, වයසට යාම, ලෙඩවීම සහ මරණය යන දුකෙන් මිදීමට මාර්ගයක් සොයන බව පැවසුවා.

※කරුණාකර අවසරයකින් තොරව නැවත මුද්‍රණය කිරීමෙන් වළකින්න.



## බුද්ධත්වයට පත්වීම







බුදුන් වහන්ස, ශරීරයට දුක් දීම බුද්ධත්වයට පත්වන මාර්ගය නොවන බව වටහාගෙන වනයෙන් පිටතට පැමිණ ශරීරය පිරිසිදු කර ගැනීමෙන් පසු සුජාතාවගේ කිරිපිඩු දනය වළඳ ශක්තිය ලබාගෙන බෝධි වෘක්ෂය යට සිට භාවනා කිරීම ආරම්භ කරන ලදි. ඒ මොහොතේ නාරිලතාවන් පැමිණ නටමින් ගයමින්ද, යක්ෂයින් පැමිණ බිය ගන්වමින්ද භාවනාවට බාධා කල නමුත්, බුදුන් වහන්ස එක සිතින් භාවනා කර අවසානයේ ලොවුතුරා බුද්ධත්වයට පත්වූවා. ඒ වනවිට වයස අවුරුදු 35 ක් වූ අතර, දිනය දෙසැම්බර් මස 8 වැනි දින හිමිදිරිය වූවා. බුද්ධත්වයට පත් වූ ස්ථානය බුද්ධගයාව ලෙස හඳුන්වන අතර එය පූජනීය ස්ථානයක් බවට පත් වූවා.

**ඔබේ දැනුමට**

බුදුන් වහන්ස බුද්ධත්වයට පත්ව බුද්ධ නම් වූවා. බුද්ධ යනු ‘ලෝක සත්‍ය අවබෝධ කරගත් පුද්ගලයා’ යන්නයි. බුද්ධත්වයට පත් වූ ස්ථනයේ වූ වෘක්ෂය අත්තික්කා වර්ගයක් වන අතර එය බෝධි වෘක්ෂය ලෙස හඳුන්වයි.

# Rissho Kosei-kai: A Global Buddhist Movement




**Rissho Kosei-kai Buddhist Church of Hawaii**
2280 Auhuhu Street, Pearl City, HI 96782, USA
TEL: 1-808-455-3212 FAX: 1-808-455-4633
Email: sangha@rkhawaii.org URL: http://www.rkhawaii.org

**Rissho Kosei-kai Maui Dharma Center**
1809 Nani Street, Wailuku, HI 96793, USA
TEL: 1-808-242-6175 FAX: 1-808-244-4625

**Rissho Kosei-kai Kona Dharma Center**
73-4592 Mamalahoa Highway, Kailua-Kona, HI 96740, USA
TEL: 1-808-325-0015 FAX: 1-808-333-5537

**Rissho Kosei-kai Buddhist Center of Los Angeles**
2707 East First Street, Los Angeles, CA 90033, USA
TEL: 1-323-269-4741 FAX: 1-323-269-4567
Email: rk-la@sbcglobal.net URL: http://www.rkina.org/losangeles.html

Please contact Rissho Kosei-kai Buddhist Center of Los Angeles
**Rissho Kosei-kai Buddhist Center of Arizona**
**Rissho Kosei-kai Buddhist Center of Colorado**
**Rissho Kosei-kai Buddhist Center of San Diego**
**Rissho Kosei-kai Buddhist Center of Las Vegas**
**Rissho Kosei-kai Buddhist Center of Dallas**

**Rissho Kosei-kai of San Francisco**
(Address) 1031 Valencia Way, Pacifica, CA 94044, USA
(Mail) POBox 778, Pacifica, CA 94044, USA
TEL: 1-650-359-6951 Email: lotusbuddhist@gmail.com
URL: https://sf-buddhism.org/

Please contact Rissho Kosei-kai of San Francisco
**Rissho Kosei-kai of Sacramento**
**Rissho Kosei-kai of San Jose**

**Rissho Kosei-kai of New York**
320 East 39th Street, New York, NY 10016, USA
TEL: 1-212-867-5677 Email: rkny39@gmail.com URL: http://rk-ny.org

**Rissho Kosei-kai of Chicago**
1 West Euclid Ave., Mt. Prospect, IL 60056, USA
TEL: 1-773-842-5654
Email: murakami4838@aol.com URL: http://rkchi.org

**Rissho Kosei-kai of Fort Myers**
URL: http://www.rkftmyersbuddhism.org

**Rissho Kosei-kai Dharma Center of Oklahoma**
(Address) 2745 N.W. 40th St., Oklahoma City, OK 73112, USA
(Mail) POBox 57138, Oklahoma City, OK 73157, USA
TEL: 1-405-943-5030 FAX: 1-405-943-5303
Email: rkokdc@gmail.com URL: http://www.rkok-dharmacenter.org

**Rissho Kosei-kai Dharma Center of Dayton**
617 Kling Drive, Dayton, OH 45419, USA
URL: http://www.rkina-dayton.com

**The Buddhist Center Rissho Kosei-kai International of North America (RKINA)**
2707 East First St., Suite #1, Los Angeles, CA 90033, USA
TEL: 1-323-262-4430 FAX: 1-323-269-4567
Email: info@rkina.org
URL: https://www.buddhistcenter-rkina.org

**Rissho Kosei-kai of Vancouver**
Please contact RKINA

**Rissho Kosei-kai International**

**Rissho Kosei-kai Buddhist Center of San Antonio**
(Address) 6083 Babcock Road, San Antonio, TX 78240, USA
(Mail) POBox 692148, San Antonio, TX 78249, USA
TEL: 1-210-558-4430 FAX: 1-210-696-7745
Email: dharmasanantonio@gmail.com
URL: http://rksabuddhistcenter.org

**Rissho Kosei-kai of Seattle's Buddhist Learning Center**
28621 Pacific Highway South, Federal Way, WA 98003, USA
TEL: 1-253-945-0024 Email: rkseattlewashington@gmail.com
URL: http://buddhistlearningcenter.org

**Risho Kossei-kai do Brasil**
Rua Dr. José Estefno 40, Vila Mariana, São Paulo-SP, CEP 04116-060, Brasil
TEL: 55-11-5549-4446, 55-11-5573-8377
Email: risho@rkk.org.br URL: http://www.rkk.org.br

**在家佛教韓国立正佼成会　Korean Rissho Kosei-kai**
〒 04420 大韓民国 SEOUL 特別市龍山區漢南大路 8 路 6-3
6-3, 8 gil Hannamdaero Yongsan gu, Seoul, 04420, Republic of Korea
TEL: 82-2-796-5571　FAX: 82-2-796-1696

**在家佛教韓国立正佼成会釜山支部**
**Korean Rissho Kosei-kai of Busan**
〒 48460 大韓民国釜山廣域市南區水營路 174, 3F
3F, 174 Suyoung ro, Nam gu, Busan, 48460, Republic of Korea
TEL: 82-51-643-5571　FAX: 82-51-643-5572

**社團法人在家佛教立正佼成會　Rissho Kosei-kai of Taipei**
台湾台北市中正區衡陽路 10 號富群資訊大厦 4 樓
4F, No. 10, Hengyang Road, Jhongjheng District, Taipei City 100, Taiwan
TEL: 886-2-2381-1632, 886-2-2381-1633　FAX: 886-2-2331-3433

**台南市在家佛教立正佼成會　Rissho Kosei-kai of Tainan**
台湾台南市東区崇明 23 街 45 號
No. 45, Chongming 23rd Street, East District, Tainan City 701, Taiwan
TEL: 886-6-289-1478　FAX: 886-6-289-1488
Email: koseikaitainan@gmail.com

**Rissho Kosei-kai South Asia Division**
Thai Rissho Friendship Foundation
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang, Bangkok 10310, Thailand
TEL: 66-2-716-8141　FAX: 66-2-716-8218

**Rissho Kosei-kai of Kathmandu**
Ward No. 3, Jhamsikhel, Sanepa-1, Lalitpur, Kathmandu, Nepal

**Rissho Kosei-kai Society of Kolkata**
89 Srirampur Road (VIP), Garia, Kolkata 700084, India

**Rissho Kosei-kai of Kolkata North**
AE/D/12 Arjunpur East, Teghoria, Kolkata 700059,
West Bengal, India

**Rissho Kosei-kai of Bodhgaya Dharma Center**
Ambedkar Nagar, West Police Line Road, Rampur, Gaya-823001,
Bihar, India

**Rissho Kosei-kai of Patna Dharma Center**
Please contact Rissho Kosei-kai Society of Kolkata

**Rissho Kosei-kai of Central Delhi**
77 Basement D.D.A. Site No. 1, New Rajinder Nagar,
New Delhi 110060, India

**Rissho Kosei-kai of Singapore**
Please contact Rissho Kosei-kai International

**Rissho Kosei-kai of Phnom Penh**
W.C. 73, Toul Sampaov Village, Sangkat Toul Sangke, Khan Reouseykeo,
Phnom Penh, Cambodia

**RKISA Rissho Kosei-kai International of South Asia**
Thai Rissho Friendship Foundation
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang, Bangkok 10310, Thailand
TEL: 66-2-716-8141　FAX: 66-2-716-8218

**Rissho Kosei-kai of Bangkok**
Thai Rissho Friendship Foundation
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang, Bangkok 10310, Thailand
TEL: 66-2-716-8216　FAX: 66-2-716-8218　Email: info.thairissho@gmail.com

**Rissho Kosei Dhamma Foundation**
No. 628-A, Station Road, Hunupitiya, Wattala, Sri Lanka
TEL: 94-11-2982406　FAX: 94-11-2982405

**Rissho Kosei-kai of Polonnaruwa**
Please contact Rissho Kosei Dhamma Foundation

**Rissho Kosei-kai Bangladesh**
85/A Chanmari Road, Lalkhan Bazar, Chittagong, Bangladesh
TEL: 880-2-41360470

**Rissho Kosei-kai Mayani**
Mayani Barua Para, Mirsarai, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Damdama**
Damdama Barua Para, Mirsarai, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Satbaria**
Village: Satbaria Bepari Para, Chandanaih, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Chendhirpuni**
Village: Chendhirpuni, P.O.: Adhunogar, P.S.: Lohagara, Chittagong,
Bangladesh

**Rissho Kosei-kai Raozan**
Dakkhin Para, Ramzan Ali Hat, Raozan, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Laksham**
Village: Dhupchor, Laksham, Comilla, Bangladesh

**Rissho Kosei-kai Dhaka North**
408/8 DOSH, Road No 7 (West), Baridhara, Dhaka, Bangladesh

**Rissho Kosei-kai Cox's Bazar**
Ume Burmize Market, Tekpara, Sadar, Cox's Bazar, Bangladesh

Please contact Rissho Kosei-kai Bangladesh
**Rissho Kosei-kai Patiya**
**Rissho Kosei-kai Ramu**
**Rissho Kosei-kai Aburkhil**

**Buddiyskiy khram "Lotos"**
4 Gruzinski Alley, Yuzhno-Sakhalinsk 693005, Russia
TEL: 7-4242-77-05-14

**Rissho Kosei-kai of Hong Kong**
Flat D, 5/F, Kiu Hing Mansion, 14 King's Road, North Point, Hong Kong, China

**Rissho Kosei-kai Friends in Shanghai**
Please contact Rissho Kosei-kai International

**Rissho Kosei-kai of Ulaanbaatar**
(Address) 15F Express Tower, Peace avenue, khoroo-1, Chingeltei district,
Ulaanbaatar 15160, Mongolia
(Mail) POBox 1364, Ulaanbaatar-15160, Mongolia
TEL: 976-70006960　Email: rkkmongolia@yahoo.co.jp

**Rissho Kosei-kai of Erdenet**
Please contact Rissho Kosei-kai International

**Rissho Kosei-kai di Roma**
Via Torino, 29, 00184 Roma, Italia
TEL/FAX: 39-06-48913949　Email: roma@rk-euro.org

Please contact Rissho Kosei-kai di Rome
**Rissho Kosei-kai of Paris**
**Rissho Kosei-kai of Venezia**

**Rissho Kosei-kai of the UK**
29 Ashbourne Road, London W5 3ED, UK
TEL: 44-20-8933-3247　Email: info@rkuk.org　URL: https://www.rkuk.org
Facebook: https://www.facebook.com/rkuk.official
Twitter: https://twitter.com/rkuk_official
Instagram: https://www.instagram.com/rkuk_official

**Rissho Kosei-kai International Buddhist Congregation (IBC )**
166-8537 東京都杉並区和田 2-7-1 普門メディアセンター 3F
Fumon Media Center 3F, 2-7-1 Wada, Suginami-ku, Tokyo 166-8537, Japan
TEL: 03-5341-1230　FAX: 03-5341-1224　URL: http://www.ibc-rk.org

**Published by Rissho Kosei-kai International**